# 3

# වැව්බැඳි දනව්වේ සප්ත වාර්ෂික වැව් දේවකාරිය හෙවත් මුට්ටිමංගල්ලය

වසන්ත කේ. දිසානායක

---

## හැඳින්වීම

හෙළ සභ්‍යත්වයේ හා ශිෂ්ටාචාරයේ මූල ධාතුව වැව් බැඳි නිම්නයේ ප්‍රතිෂ්ඨාපිත වන්නේ සිංහල ජාතියට පමණක් අනන්‍ය වූ කෘෂි වාරි සංස්කෘතියක් ද නිර්මාණය කරමිනි.වියළි කලාපයේ සෑම පැරණි ගමකම පාහේ අදටත් අවිනෂ්ට වූ **ගම්වැව්** පැවතීම උක්ත සන්සිද්ධියේ ප්‍රතිඵලයකි. එබැවින් සිංහල සභ්‍යත්වයේ හා සංස්කෘතියේ උපැත්ම, පැවැත්ම හා වාරි ශිෂ්ටාචාරය අතර ඇත්තේ ඓන්ද්‍රිය සබඳතාවකි.

අතීත මානවයා සතුව පවතින පාරම්පරික ඥාන සම්භාරය හා ජලය අතර ඇති සබැඳියාව විශේෂ වූවකි. ස්වභාවදහමේ නීතිය පිළිගන්නා ඔවුහු ඒ හා බද්ධ වෙමින් අතීත සංසිද්ධීන් මෙන්ම පාරකාලික (Diachronic or temporal) අත්දැකීම් හා අත්විඳීම්මත ස්වභාදහම සමඟ සහජීවනයෙන් කටයුතු කිරීම පිණිස ඇතිකර ගන්නා ලද සම්මුතීන් ඔස්සේ ක්‍රියාත්මක වෙති. මෙකී පිරිස් ස්වභාදහම ආරක්‍ෂා කරමින් කෘතගුණ සලකන්නේ අධිභෞතික බලවේග හා බද්ධ වෙමිනි. ඒ මගින් ඔවුන් බලාපොරොත්තු වන්නේ මානසික ඒකීයත්වයයි (Psychic unity). වැසි ජලය රඳවා ගනිමින් කෘෂිකර්මාන්තයේ නියැලෙන වැව්ගම්වාසීන් වැවට දක්වන්නේ අසීමිත ගෞරව සම්ප්‍රයුක්ත භක්තියකි. ඔවුන් වැවට දේවත්වයක් යා කරමින් අස්වැන්නේ මුල් කොටස (අග්‍ර ශෂ්‍ය) **සත්වසරකට** වරක් වැවේ වෑකන්දේ පුදා මුට්ටි නැමීමේ මංගල්ලය සිදුකර සොබාදහම වන්දනාමාන කරමින් කෘතගුණ සලකන්නේ තම ආරක්ෂාව, සෞභාග්‍ය, සශ්‍රිකත්වය මෙන්ම ලෞකික හා අධ්‍යාත්මික සැනසීම උදාකර ගැනීමේ අපේක්ෂාවෙනි. මෙවැනි පූජා චාරිත්‍ර හා බැධී වතාවත් තුළ අන්තර්ගත හරය වන්නේ ජෛව විවිධත්වය ආරක්‍ෂා කරමින් ස්වභාවික සම්පත් කළමනාකරණයත් මෙන්ම සම්පත් නිසිලෙස පරිහරණයත්

උදෙසා සමාජය මෙහෙයවමින් සමාජ වටිනාකමක් ලබාදීමට (Social Order & Social Value) හා හෙළ ගැමියා සතු පාරම්පරික ඥානය (Indigenous Knowledge) ඒ සඳහා උපයෝගී කරගත් ක්‍රියා පටිපාටියයි.

**ප්‍රවේශය : මුට්ටිනැමීමේ ප්‍රභවය හා විකාසනය**

අද්‍යතන මුට්ටිනැමීමේ මංගල්ලයේ ප්‍රාරම්භක අවස්ථාව පොම්පරිප්පු සුසානයේ නෂ්ටාවශේෂ තුළ අන්තර්ගතව ඇති බව මුදියන්සේ දිසානායක අවධාරණය කරයි (2003:56). මෙකී සුසානයෙන් හමු වූ මැටි බරණි සමඟ වී ඇට, දහයියා පොතු, තඹ ඇණ, රෙදිකැබලි, සත්ව ඇටකටු ඊට සාක්ෂි සපයයි (Begly 1981:53-95). අද ද ගැමියෝ මුට්ටිමංගල්ලයේ දී පේ කරනලද මුට්ටි තුළට කහ දෙහි මිශ්‍ර දියෙන් පිරිසිදු කළ තඹකාසි යෙදීම මෙන්ම පනම් බැදීමේ දී කාසියක් රෙදිකඩක ගැටගැසීම සිදුකරති. උක්ත සංසිද්ධිය වෙනස් මුහුණුවරකින් අතීතයේ පැවැතිබවට පොම්පරිප්පු සුසානයෙන් ලත් අමුද්‍රව්‍ය සාක්ෂි දරයි. මුට්ටි නිලකිරීමේ දී භාවිත වන සංකේත වූ**කතිර, බිංදු, ත්‍රිශූල, ඉරි හා චක්‍ර** ලකුණු ආදිය පොම්පරිප්පු සුසානයේ වූ වළංකැබලි තුළ චිත්‍රණයකර තිබීමත් තෝනිගල, පරමාකන්ද සෙල්ලිපියේ ඊට සාම්‍ය වූ සංකේත පැවතීමත් හා සෙනරත් පරණවිතානයන් ඉදිරිපත් කරන බ්‍රාහ්මී නොවන සංකේත තුළ ඉහත සලකුණු ඇතුළත් වීමෙනුත් අනාවරණය වන්නේ මෙම සංකේතකරණය ක්‍රිස්තු පූර්ව යුගයට අයත් බවකි. එමෙන්ම කිරි ඉතිරවීම, මුට්ටි නැමීම, කමත් අටමඟල ආදියේ දී උක්ත සංකේත යොදාගැනීම වූ කලී නුවරකලාවිය ජනයා මෙකී පුදපිළිවෙත් දූරාතීතයේ සිට පවත්වාගෙන එන බවට සාක්ෂියකි. අප අධ්‍යයන ක්ෂේත්‍රයේ වූ **හොරොව්පොතාන** ප්‍රදේශයේ දිවුල්වැව ග්‍රාමයේ ගල්පෙට්ටියක බහාලූ උපකරණ අතර නගුලක කොටසක් යැයි අනුමාන කළ උපකරණයක් ද විය (Senevirathna 1984:272) කෘෂි කර්මාන්තයට යොදාගත් උපකරණ පූජාර්ථය පිණිස පොළව යට තැම්පත් කිරීමක් ලෙස මෙය සැලකීම වටී.තත් ප්‍රදේශයේ ජනයා දූරාතීතයේ සිටම කෘෂිකර්මාන්තය හා බද්ධ වූ ඇදහිල්ලක නිමග්නව සිටි බව මෙමගින් තහවුරු වේ.

පොම්පරිප්පු සුසානයේ අවශේෂයන්ට සමාන වූ මුට්ටිනැමීමක් පිළිබඳව ක්‍රිස්තු වර්ෂ 1883 දී මින්නේරිය හා කන්තලේ අසල වනලැහැබක ඇසින් දුටු සාක්ෂියක් සී. එෆ්. කොමින්ග් සඳහන් කරයි (Cummings 1893:400).වත්මන් මුට්ටිනැමීමේ මංගල්ලයේ යටගියාව ක්‍රිස්තු පූර්ව 950-100 අතර කාලයට අයත් බවත් එහි ප්‍රාරම්භක ස්වරූපය පොම්පරිප්පු සුසානයෙන් ලද මූලාශ්‍රවල ස්වභාවය ගන්නා බවත් පොම්පරිප්පු වූ කලී හුදෙක් ආදි කාලීන සුසානයක් පමණක්ම නොව කිසියම් වූ ඇදහිලි විශ්වාසයක් ප්‍රායෝගිකව පැවැත් වූ ස්ථානයක් බවත් මුදියන්සේ දිසානායක අවධාරණය කරයි (2003:61).

මුට්ටිනැමීමේ මංගල්ලයේ අරමුණු නුවරකලාවිය තමන්කඩුව හත්කෝරළය ආදී ප්‍රදේශයන්හි දී එකහා සමාන වුවද එහි පූජාවිධිරටාව, ක්‍රමවේදය හා වන්දනීයත්වයට පාත්‍රවන දේව සමූහයා ආදී දෑ එක් එක් ප්‍රදේශයේ පාරම්පරික ජන විඥානයට අනුව සිදුවනු පෙනේ.කුමාර වන්නි පළාතේ වූ මුට්ටි මංගල්ලය **හත්කට්ටුවේ රාජකාරිය** නමින් හඳුන්වයි (ධීසානායක 2003:61). එය කිරි ඉතිරුම් මංගල්ලයට ප්‍රමුඛත්වයක් දී සිදු කරන්නකි. විලච්චි කෝරළයේ පේ මඩුවේ මුට්ටි නැමීමේ මංගල්ලය **වැවේ රාජකාරිය** යනුවෙන් වහරති (මානෑව 2004:153-165). හත්කෝරළ ප්‍රදේශයේ පවත්නා මුට්ටිමංගල්ලය ඊටම ආවේණික තත්ත්වයක් දරයි (දළුපොත 2003:7-75). කනදරාකෝරළයේ මුට්ටිමංගල්ලය **මුට්ටිනැමීමේ පෙරහැර** නම් වේ (අනුරින් ඉන්ධිකා 2002:57-67).

## කල්පේ කෝරළේ මුට්ටිනැමීමේ මංගල්ලයේපූජාවිධි රටාව

අපගේ අධ්‍යයන ක්ෂේත්‍රය වූ නුවරකලාවිය ධීසාවනියේ කල්පේ කෝරළයට අයත් කිඹුල්පැටියාව ග්‍රාමයේ වැකන්දේ පැවැති මුට්ටිනැමීමේ මංගල්ලය අයිවර්ස් විස්තරකරන ලද මුට්ටිමංගල්ලයට සමාන පූජාවිධිරටාවක් අනුගමනය කරයි.ඉන් ගම්‍යමාන වන්නේ අතීතයේ සිටම සම්ප්‍රදාය විරෝධී නොවන පරිධී වර්තමානය දක්වාත් තත් ප්‍රදේශයේ මෙකී දේවකාරිය රැකගැනීමට ගැමිවිඥානය සමත්ව ඇතිබවකි.

## පනම් බැඳීම

නුවරකලාවිය වාසීන් (හත්කෝරළය,තමන්කඩුව,කනදරාකෝරළය) ආදී අනෙකුත් වැව් ගම්මානයන්හි මීට වෙනස් වූ පූජාවිධි රටාවකින් මෙකී ශාන්තිකර්මය ආරම්භ කළද අරමුණ පොදු බවක් පෙන්වයි. හුන්නාකඩ ධීයවර මංගල්ලයේ දී අය්‍යනායක,පනම් බණ්ඩාර ප්‍රමුඛ දෙවිදේවතා විෂයෙහි පනම්බැඳ (පඬුරු බැඳ) කන්නලව්කර සිටින්නේ දේව අනුහසින් වැසිලැබ වැව පූරවා ශෂ්‍ය භෝග වර්ධනය කරදෙන ලෙසත් එලෙස පිහිට වූ දේවතා සමූහයාට අස්වනු ලැබ අටුකොටු පිරීගිය කල වැකන්දේ අක්යාලින් කිරි උතුරා මුට්ටි මංගල්ල පවත්වා කෘතගුණ සලකන බවත්ය(Ivers1889:109-110).

> "අවසර . . . . අවසර . . . . අවසර . . . . ආයිබෝවේවා . . . .
> පස්වාන් දහසකට බුදුවන්ඩ කරුණාවෙන් වදාරන්ඩ අය්‍යනා බණ්ඩාර පනම්බණ්ඩාර ගලේ බණ්ඩාර වැවේ බණ්ඩාර කඩවර බණ්ඩාර රත්තරං බණ්ඩාර ඔබ වහන්සේලා වැවට ගමට වෙලට යහතින් ධීවැස් හෙලා බැල්ම හෙලා වදාරන මහා සත්‍යානුභාවයේ බලයෙන් . . . . ඇතුන් බැන්ද වූ රන් පනමට රිදී පනමට උඩ්රිප්පුවට බැල්මකර වදාරා පනම් බණ්ඩාර

හාමුදුරුවෝ ඔබවහන්සේ වැස්සවලාහක දේවතාවන්ට අණසක පතුරවා වැව පුරවා සකල ඓශ්චර්ය සෞභාග්‍ය පතුරවන්ට . . . . ආයුබෝවේවා . . . . ආයුබෝවේවා . . . . !"

## ධීන නියම කිරීම

වෙල්විදානේ, ගමරාල, අනුමැතිරාළ මූලිකව ගම්වාසී සියලු දෙනාගේ සහභාගිත්වයෙන් මුට්ටි මංගල්ලය පවත්වන ධීන නියම කිරීම සිදු වේ. ගොයම් කපා පාගා අස්වනු ගෙට ගැනීමෙන් පසු කිඹුල්පැටියාව ග්‍රාමයේ මුට්ටිමංගල්ලය අය්‍යනායක දෙවියන් ප්‍රමුඛ දේවසමූහයා උදෙසා **සප්තවාර්ෂිකව**ඇසළ මාසයේ කෙම්මුර ධීනයක දී සිදුකරනු ලබන්නේ ඊටම ආවේණික අනන්‍යසාධාරණ ලක්ෂණ වලින් යුක්තවය.

## පෙර සූදානම

මංගල්ලයට ධීන නියම කිරීමෙන් පසු මූලික කටයුතු කිහිපයක් සිදුකෙරේ. පළමු කටයුත්ත වන්නේ මංගල්ලයට සහභාගීවන සියලු දෙනා ධීන හතක් කිළි කුණු හා මස් මාළු පිළිහුඩුවලින් තොරව පේ වීමයි. එය විශේෂත්වයකි.එය පූජා කර්මයේ නිසිඵල ලැබීමට හේතුවන බව ඔවුන්ගේ විශ්වාසයයි. ඊළඟ ප්‍රමුඛ කාර්යය වන්නේ සම්ප්‍රදායානුකූලව මංගල්ලයට සහභාගිවන බඩහල්රාළ, වාජ්ජංකරුවන්, කෝල්මුරකරුවන් සහ හේනෙ මාමා යන මෙහෙවර කරුවන්ට බුලත් නම්බු දී මංගල්ලයට පැමිණෙන ලෙස අරාධනා කිරීමයි. එය වෙලේ විදානේ හෙවත් ගමේ ප්‍රධාන ගමරාල ඇතුළු තවත් ප්‍රභූවරු මුට්ටි නැමීමට සතියකට පෙර දී සිදුකරති. මෙම මංගල්ලය සිදුකරන වැව සමීපයේ **සන්හිඳ** පිරිසිදු කොට සකස් කිරීම මේ අතර සිදු වේ.

## දේව මෙහෙවර හා පූජාකර්මයේ ආරම්භය

මංගල්ලය පැවැත්වීමට පෙර ධීනයේ දී ගමේ පංගුකාරයෝ සියලු දෙනා තම තමන් භාරගත් අක්යාල හාල්, පොල්, කැවිලි, පලතුරු බුලත් පුවක් හා හකුරු යනාදී අවශ්‍ය සියලු කළමනා විදානේ මහතාගේ නිවසට සපයති. නියමිත ධීන උදාවීමත් සමඟ එධීන සවස් භාගයේ මෙම මංගල්ලය සිදු කිරීමට බුලත් නම්බු ලැබූ මෙහෙවර කරුවෝ විදානේ මහතාගේ නිවසට තම භාණ්ඩද රැගෙන පැමිණෙති. බඩාල්රාළ තමා සැදූ මුට්ටි සුදුපිරුවටින් ඔතා කපුරාළට පිළිගන්වන්නේ ඉතා ගරුසරු ඇතිවය. බඩාල්රාළගේ මෙහෙවර මහන්සියට වෙල් විදානගෙන් බුලත් හුරුල්ලක් මත තබා පඬුරුකි. මංගල්ලය සිදු කරන ධීනයේ දී ගමෙන් පිටත සිටින අයගේ පැමිණීම අනිවාර්යය. මෙම චාරිත්‍ර නොතකන අය දේව උදහසට ලක්වන බව ගම්මු තරයේ විශ්වාස කරති. ගමේ පට්ටි අයිතිකරුවෝ පට්ටියේ කුළුඳුල්

දෙනුන්ගෙන් දෝවාගත් මී කිරි ගෙනවිත් විදානේට භාර දෙති. මුට්ටි අත ඇති කපුරාල මුට්ටි තුනම හඳුන් කිරිපැණියෙන් නාවා දුම්මල අල්ලා එම කිරි මුට්ටි තුනට බහාලන්නේ පිරුවට හැඳ පන්සිල්හි පිහිටුවීමෙන් අනතුරුවය. කිරි බහාලූ මුට්ටි සුදු රෙධිකඩකින් වසා තබති. මිනිසුන් හා තිරිසනුන් අතර වසංගත පැතිරගිය කල්හි මුට්ටිනැමීම හා සමාන වූ පූජාකර්මයක් කළබවට අයිවර්ස්ගේ සඳහන මෙමගින් තහවුරු වේ(Ievers1889:109-110).

නුවරකලාවියේ ජනතාවටඅතීතයේ සිටම කෘෂිකර්මාන්තයේ දී පිහිටවූයේ ගවයින්ය. ගවයින් දෙවියන් බඳුය. ඒ නිසාම ගවමහීෂාදීන් ලෙඩදුක් විපත්වලින් ආරක්ෂාකර දෙන ලෙස සෑම සියලු දේව කාරියක දීම දෙවියන්ට කන්නලව් කිරීමට මොවුහු අමතක නොකරති. එම දෙවියන් විෂයෙහි කෘතගුණ දැක්වූයේ එළගිතෙල්වලින් දෙවියන්ට ආලෝකපූජා පැවැත්වීමත් නැවුම් එළකිරෙන් දෙවියන් උදෙසා කිරි මුට්ටියක් ඉතිරවීමත්ය. අතීතයේ දී ඇතැම්විට දෙවියන් උදෙසා සත්වබිලි පූජා පවතින්නට ඇති වබට සාක්ෂි පොම්පරිප්පු සුසානයේ වූ සත්ව ඇටකටු තුළින් ලැබුනද බෞද්ධාගමික සංස්කෘතිය ස්ථාපිත වීමත් සමඟ අවිහිංසාවා දී ක්‍රමවේදයක් ඔස්සේ දේව වන්දනය ප්‍රතිනිර්මාණය වූවාට සැකනැත.

**හැන්දෑ තේවාව**

මුට්ටි මංගල්ලයට පෙරධීන සවස් භාගයේ දී වෙල්විදානේ ගේ නිවසේ දී පූජාකර්මය සඳහා සුදානම් කරන ලද සියලු පූජා ද්‍රව්‍ය වැව පාමුල සංහිඳට වැඩමවීමට පෙර දුම්මල අල්ලා මුට්ටි කඳ පේ කිරීම සිදුකළ යුතුය. අනතුරුව දේවාභරණ සහිත පෙට්ටිය ද දුම්මල අල්ලා පේකොට දැකුම් තැබීම කරයි. දැකුම් තැබීම වූ කලී කපුරාළ හෝ ගමේ ප්‍රධාන කෙනෙකු බුලත් අතකට පඬුරු තබා තෙවරක් වැඳීම සිදු කීරීමයි. දැකුම් තැබීමෙන් අනතුරුව මෙම ස්ථානයේ දී ද දෙවියන් වැඩම වීම වූ කලී අනුමැතිරාළ හෙවත් කපුරාළ දේවාරූඪයට පත්ව ඉධිරි වැඩ පිළිබඳ උපදෙස් ලබාදීමයි.

**මුට්ටි කඳ සන්හිදට වැඩමවීම**

ඉන් අනතුරුව හේවිසි කෝල්මුර පෙරහරින් කපුරාළ හා ගමරාළ ප්‍රමුඛ ගමේ ප්‍රභූවරු සමඟ දේව ආභරණ සහිත පෙට්ටිය පේ කරන ලද මුට්ටි හා අනෙකුත් ද්‍රව්‍ය කත්බැද සුදු වියන් යටින් විදානේගේ නිවසේ සිට **සන්හිදටවැඩමවීම** හේවිසි කෝල්මුර උඩැක්කි සහිත සිදු වේ. කෝල්මුර ගයා කැදවන දෙවියන් සෙල්ලම් කිරිමත් මෙම පෙරහැරේ දී සිදු වේ. ඒ සඳහා ගමේ සියලූ දෙනාම සහභාගී වීම දක්නට ලැබේ.

### බුලත් යහන් දීම

දේවාභරණ සහිත පෙරහැර සංහිඳට පැමිණීමෙන් පසු වැඩමවන ලද දේව ආභරණ හා පේ කළ මුට්ටි පෙර සකස් කරන ලද පූජාසනයක් මත තැන්පත්කර පළමු බුලත් යහන් දීම සංහිඳ අසලින් ඇරඹේ.සියලු කටයුතු පිරිමි පාර්ශවය මගින් සිදුකරන්නේ **කිළි** සංකල්පය මෙම කටයුතු අඩපණ කිරීමට හේතුවන බව ගැමියන් තදින්ම විශ්වාස කරන හෙයිනි. අනතුරුව මුට්ටි නැමීමට නියමිත වැකන්ද පාමුල පූජාසනයේ කපුරාළ ඇතුළු සහයක පිරිස විසින් මල්පැලේ බුලත් යහන් දෙන්නේ හේවිසි කෝල්මුර සමගින් යහන පේ කරනු ලැබීමෙන් අනතුරුවයි. බුලත් මඩ දීමට මෙම ස්ථානවලට වෙනම තිදෙනෙක් සුදු පිරුවට හැඳ පේවී සිටියයුතුය. මුට්ටි ගස අසල මල්යහනට,වැවට අරක්ගත් ප්‍රධාන දෙවියන් වන අයියනායක දෙවියන්ට ප්‍රධාන මඩය මෙහි දී පිරිනැමේ. එක් එක් දෙවියන් උදෙසා දෙනු ලබන මඩවලට අයත් බුලත් හා පුවක් නිවැරධිව සකස් නොකිරීම ගමට වස් වැදීමට හේතුවන බව ගැමියෝ තදින් විශ්වාස කරති. බුලත් මඩය සකස්කළ පුද්ගලයා අතින් වූ අත්වැරධි කටවැරධි මංගල්ලය අවසානයට බහිරව දෙවියන්ට දෙනු ලබන මඩයෙ දී නිවැරධි කරගත යුතුය. මෙම මඩය ඔහු විසින්ම තනිවම ධීය යුතුය. මොහු විසින් මුළු ගමම රැකගත යුතුය. අයියනා දෙවියන්ට මඩය දුන් මල්යහන පාමුල ඉලන්දාරී දෙවියන්ට බුලත් මඩය ධීයයුතුය. මෙහි විශේෂත්වය වන්නේ මයිල හා බෝල්පනා කොළ යොදාගනිමින් මෙම මඩ දෙක සාදනු ලැබීමයි. මයිල මඩය හා බෝල්පනා මඩය ලෙස මෙම මඩද්වය ව්‍යවහාරයේ එයි.ඉන් අනතුරුව පස්දෙනා මඩය යනුවෙන් තවත් දෙවිදෙවතාවන් කිහිප දෙනෙකුට එම ස්ථානයේ දීම මඩ කිහිපයකි. ඒ බාල කම්බිලි මඩය, බාල පත්තිනි මඩය, බාල කඩවර මඩය,හොර මඩය, සියලු දෙවියනට දෙන මඩය වශයෙනි.පස් දේවතා මඩය ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් මුහුණුවරක් ගනී.සියලු මඩ දීමෙන් අනතුරුව එක් පුද්ගලයෙක් මෙම මඩ ලඟ නවතා අනෙක් සියල්ලෝ සන්හිඳ ලඟට එක්රොක් වෙති.

### දන්සලේ බත දීම

රාත්‍රි ආහර වේල **දන්සලේ බත දීමයි.** මෙම ස්ථානයේ දීම සියලු දෙනාටම **බත** ලැබේ. මෙම ආහාර හඳුන්වන්නේ "දන්සලේ බත දීම" යනුවෙනි. පිළිහුඩු කිසිවක් ඇතුළත් නොකරන මෙම බතට අඩංගු වන්නේ බත්, කිරි හොද්දක්, වට්ටක්කා හා අගුණ කොළ මැල්ලුමක්ය. ගමේ වැඩිහිටි කාන්තාවන්ගේ පිරිසිදු දෑතෙන් සකස්වෙන මෙම ආහාර වෙල සන්හිඳ අසලම සුදානම් කිරීම සිරිතයි.

### වාජ්ජංකරුවන්ගේ ශබ්ද පූජා

දන්සල් බතින් අනතුරුව කපුරාළ යහන පේකර යහනට ආවැඩිය පසු හේවිසි හා නැටුම් කණ්ඩායම එතැන් පටන් ඒක් එක් පුද්ගලයාට සෙත් කවි කියමින් රාත්‍රිය මුළුල්ලේම චිරාගත සම්ප්‍රදායානුකූල නැටුම්, ගැයුම් හා වැයුම්ය. මේ මගින් සියලුම

දෙනාට විනෝදස්වාදය ගෙනදීම මතු නොව තරාතිරමකින් තොරව ගමේ සියල්ලෝම කමත නම්වූ රඟමඬලට එක්රොක්වීමම විශේෂයෙන් සඳහන් කළයුතු කරුණකි. මේ අතර තේපැන් සංග්‍රහ කීරිමටද ගමේ උදවිය අමතක නොකරති.

## අලුයම් පෙරහැර

වැවේ වැකන්දට කහාකැටේ ඉර පායන්නට පෙර දෙවියන්ට ශබ්ද පූජා පැවත්විය යුතුය. මෙහි දී ගම්වැසියෝ සුදු වියන් යටින් මුට්ටි හා මුට්ටි මංගල්ලයට අවශ්‍ය සියලුදේ ද කලින් භාර භාර වූ සියලු දේද මේ පෙරහැරේ දී රැගෙන ඒමට අමතක නොකරති. දෙවියන් කැදවීම හා දෙවියන් සෙල්ලම් කිරීමද ඒ අතර සිදු වේ. තුන්මන්සල් හා සිව්මංසල් වල දී දෙවියන් ආරූඪවීම අනිවාර්යෙන්ම සිදු වීම විශේෂත්වයකි. දෙවියන්ගේ බැල්ම, ධෛර්යය නිසා දෙවියන් ආරූඪවීම සිදු වෙන බව ගම් වැසියන්ගේ අදහසයි. පැදුරක් මංසන්ධියේ එලා තුන්මන් සලක දී තෙවරක් ද සිව් මංසලසක දී සිව්වරක්ද ආරූඪවීම සිදුවේ. මෙහි දී යටිගිරියෙන් කෑ ගැසිමත් දෙවියන්ගේ බැල්ම ඇති ගම්වාසීන්ටද දෙවියන් ආරූඪවීම දැකගත හැකිය.

## වැ කන්දේ අලුයම් තේවාව

පෙරහැරින් වැකන්දට පැමිණි පසු පෙරධින පේකළ යහන් දුම්මල අල්ලා නැවත පේකරමින් කපුරාළ යාතිකා වන්නේ පෙර බාරහාර දී විරාගත සිරිත්විරිත් කිලුටු නොකර මෙම මංගල්ලය සිදු කරන බවට දෙවියන්ට පොරොන්දු වෙමිනි. මේ අතර කෝල්මුර උඩැක්කි නාද මධ්‍යයේ පෙරහැරෙන් වැඩම වූ මුට්ටි තුන දේව යහන් මත තබා අනුමැතිරාළ නියමිත වේලාව පැමිණෙන තුරු නැවත නැවත දේවාරූඪයෙන් යාතිකා කරයි.

## පනම් බැඳීම

උක්ත මංගල්ලයේ මුට්ටි නමන ස්ථානයේ දීම පනම් දෙවියන් සඳහා පනම් බැඳීම විශේෂත්වයකි. බෝල්පනා කෙව්ටක්ගෙන පනමක් හෙවත් කාසියකින් පඬුරක් සාදා නියමිත වේලාවට කෙව්වේ ගැට ගැසිය යුතුය. ඒ ගමරාළ හෙවත් විදානේගේ දේවකාරියයි. එහි දී අනුමැතිරාළ සිදුකරන දේවකන්තලව්ව තුළින් ගම් කොටුවත් එහි ලොකුකුඩා සියලු තිරිසන් සතුන් මෙන්ම වැව කුඹුරුයාය කිසියම් කාලසීමාවකට දෙවියන්ගේ ඇල්මබැල්ම යටතට ගත්බව ප්‍රකාශ වේ. (Karunanayake 1978:67-69).

> "වැව් බැදි රාජ්ජෙට භාරව ඉන්නා වූඅය්යනායක මහරජ්ජුරුවන් වහන්ස පණම් බණ්ඩාර දෙවි හාමුදුරුවනේ පුල්ලෙයාර් දෙවි හාමුදුරුවනේ කඩවර බණ්ඩාර දෙවි හාමුදුරුවනේ ඔබ වහන්සේලාගේ ආනුභාවයෙන් ආඥාවෙන් මේ ගමේ ඉන්නා වූ කිරිසප්පයාගේ පටන්

දන්නානොදන්නා අය ගව මහීෂයෝ වතුපිටි හා වැවත් ආරක්ෂාකර දී ඉධිරි වර්ෂ හත ඇතුළත මේ ගමේ කිසිම කෙනෙකුට ලෙඩක්දුකක් වසංගතයක් උණක් හිසරදයක් නොවී අපගේ හරකාබාන භවබෝග රැකදෙන්ඩ හොඳයි....මේ ආනුභාවයි ....අවසර ආයුබෝ වේවා....!ආයුබෝවේවා....!"(පඤ්ඤානන්ද හිමි 2000:91).

පනම් බඳින ස්ථානයේ දී බෝල්පනා මඩයක් දීම ගමරාලගේ දේව කාරියයි. පනම් බැඳීමෙන් අනතුරුව මුට්ටි නැමීම සිදු කරයි.

**මුට්ටි නැමීම**

හඳුන් කිරි පැණින් පවිත්‍රකර නැවුම් එළකිරි පුරවා ඇති මුට්ටි තුන නැමීමට විශේෂ කෙනෙකු පේවී සිටියි. කපුරාල ඔහුගේ නළලේ පරහඳ ගා යාතිකා කිරීමෙන් පසු හේවිසි අහින පද මධ්‍යයේ නැකැත් වේලාවට වෑකන්දේ වැවට මුහුණලා වැව් කෝල්බඩ සදා තිබූ තුනත්තක් සහිත මුට්ටි ගසෙහි මුනින් අතට මුට්ටි නමයි. මුට්ටිවල ඇති කිරි වැව් ජලයට මිශ්‍ර වේ. මුට්ටි නැමීමෙන් පසු මුවහත් පිහියකින් මුට්ටි ගසට තෙවරක් කෙටීම වැව්බැඳි දනව්වටම ආවේණිකවූවකි. අනතුරුව ගම්වාසීන්ගේ බාරහාරාදිය මුට්ටි ගස පාමුල ඔප්පු දී පූජාමඩය භාරව සිටි පුද්ගලයා **බහිරව දෙවියන්ට "හොර මඩය"** පුදදෙන විට සියලු දෙනාම නැවත සන්හිඳ අසලට රැස්වෙති.

**කිරි ඉතිරීම**

මුට්ටි මංගල්ලයෙන් පසු කිරි ඉතිරීම සිදුකරති. කපුරාළ ඇතුළු කිහිප දෙනෙක රජ හැළියේ කිරි උතුරවා මුට්ටි නැමූ තැන දී කිරිබත් සහිත පලතුරු ගොටු පුදා දෙවියන් උදෙසා පුදදෙති.

**කතරගම දෙවියන්ගේ දානය**

අනතුරුව සියලු දෙනා කිරිබත සප්පායම් වී දහවල් දානය කතරගම දෙවියන් උදෙසා සකස් කරති. බත ඇතුළුව ව්‍යංජන හතකින් යුත් මෙම දානය සන්හිඳ පාමුළ සාදා තිබූ කතරගම දෙවියන්ගේ මල්පැලට පිළිගැන්වීමෙන් පසු ගම්වැසියන් සියලු දෙනාද දානය අනුභව කොට නිවෙස්වලට පිටත්වයති.

මෙලෙස කිඹුල්පැටියාව ග්‍රාමයේ හුන්නාකඩ ධීයවර මංගල්ලයෙන් ආරම්භවන පූජා කර්මය මුට්ටිමංගල්ලය තුළින් නිමාව දකී. ස්වභාව ධර්මය සමඟ සහජීවන පැවැත්මක් උදෙසා නිර්මාණය කර ගන්නා ලද මෙම සම්මුතීන් ඔස්සේ ලැබූ අත්දැකීම් හා අත්විදීම් මත උරුම කොට ගත් උක්ත දැනුම් සම්භාරයන් පරම්පරාවෙන් පරම්පරාවට ලබා දෙන්නේ එක්ව ක්‍රියාකිරීම, සමඟිය, චිත්තශක්තිය

වර්ධනය වීම, සමාජ සන්නිවේදනය, ස්වභාව දහම හා ඇති බැඳියාවයි. තවත් අතකට රාජකීය හෙවත් ඒ මහා වැව් වෙනුවෙන් ඇපකැප වී සුවිසල් මෙහෙවරක් ඉටුකොට ජන ගෞරවයට පාත්‍ර වූ "වාපිමාමක" නරදෙටුවන් කාලයාගේ ඇවෑමෙන් අභාවප්‍රාප්තව දේව ගණ ධූරාවලියට හෙවත් දේව පැලන්තියට අවතීර්ණව ඇතැයි ගැමියෝ විශ්වාස කරති. ඒ නර දේව්වරුන් වෙනුවෙන් වැව්වල කිරි උතුරුවා මුට්ටි නමා මෙබඳු මංගල්ල (මුට්ටි පෙරහැර) පැවත්වීම විශේෂ අවධානයට යොමුවිය යුත්තකි.

### ග්‍රන්ථ නාමාවලිය

දිවාකර, අනුරින් ඉන්දිකා (2002), *කනදරා කෝරළයේ ජන ඇදහිලි හා විශ්වාස*, කොළඹ: එස්.ගොඩගේ සහ සහෝදරයෝ.

දළුපොත, මහින්ද කුමාර (2005), *වැව හා සංස්කෘතිය*, කොළඹ:එස්.ගොඩගේ සහ සහෝදරයෝ.

දළුපොත, මහින්ද කුමාර (2003), *මුට්ටිමංගල්ලයේ වගතුග*, කොළඹ: එස්.ගොඩගේ සහ සහෝදරයෝ.

පඤ්ඤානන්ද හිමි, හොරොව්පොතානේ (2000),*කල්පේ කෝරළේ ඇදහිලි හා පුදසිරිත්*, කඩවත: කරුණාරත්න ඔෆ්සෙට් ප්‍රින්ටර්ස්.

පීරිස්, රැල්ෆ් (2001), *සිංහල සමාජ සංවිධානය*, බොරලැස්ගමුව:විසිදුණු ප්‍රකාශකයෝ.

මානෑව, කේ.බී. (2004), *නුවරකලාවියේ ජන මංගල්ල*, කොළඹ: එස්.ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, මුදියන්සේ (2003),*දෙමළ හත්පත්තුවේ ඇදහිලි විශ්වාස හා ශාන්තිකර්ම*, කොළඹ: එස්.ගොඩගේ සහ සහෝදරයෝ.

Karunanayake, M.M. (1978), *Mutti Mangallaya*, Vidyodaya journal of Arts science and Letters, Vol. 6.No. 2.

Cummings, Gordon, C.F. (1892), *Two Happy years in Ceylon*, Vol. 2,London:William blackwood and sons,Edinburgn and London.

Ievers, R.W. (1889), *Mannual of the North Central province in Ceylon*, Colombo:Ceylon Government printer.

Senevirathna, Sudarshana (1984), The Archeology of Megalithic Black and Red Cave Complex in Sri Lanka, *Ancient Ceylon*.No 5. Colombo: Department of Archaeology.

Ievers, R.W. (1880), Customs and ceremonies Connected With paddy Cultivation, *JRAS (CB)* Vol.vi. Colombo: Government Printer Ceylon.

Bell, H.C.P. (1883), Sinhalese customs and ceramonies connected with paddy cultivation in the low Country, *JRAS (CB)*, Vol. viii, No 26, Colombo: Government press.

Begly,Vimala (1981), Excavations of Iron Age Burials at Pomparippu 1970, *Ancient Ceylon,* No 4,Journal of the Archaeological Survey Department of Sri Lanka.


Deraniyagala, S.U. (1972), The Litadel of Anuradhapura in 1969, Excavations in the Gedige Area, *Ancient Ceylon*, No. 2. Colombo: Colombo: Department of Archaeology.


Paranavitana, S. (1979), *Inscriptions of Ceylon*, Vol. I, Archaeologycal Servey of Ceylon ,Colombo.

# ඡායාරූපාවලිය



දැකුම් තැබීම



මුට්ටිකඳ වැඩමවීම



සංහිඳේ දැකුම් තැබීම



ඉලන්දාරි යහන



මහයහන



පස්දෙනා වහන්සේලාගේ යහන



අලුයම් පෙරහැර


පේ කරන ලද මුට්ටි


උදැසන තේවාව


මුට්ටි නැමීම


බාර ඔප්පු දීම


දන්සලේ බත


පනම් බැඳීම